# පළමු කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 5.5 ක්

## සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව කියයි



**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙම වසරේ පළමු කාර්තුව සඳහා පවතින මිල ගණන් යටතේ සහ ස්ථාවර මිල ගණන් (2010) යටතේ ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක නිෂ්පාදන ප්‍රවේශයට අනුව නිකුත්කොට ඇත.**

ඒ අනුව ශ්‍රී ලංකාවේ මුළු දළ ජාතික නිෂ්පාදිතය 2016 වර්ෂයේ පළමු කාර්තුව (ජනවාරි, පෙබරවාර, මාර්තු) සඳහා ස්ථාවර මිල ගණන් (2010) යටතේ රුපියල් මිලියන 2,088,024 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි. පසුගිය වසරේ පළමු කාර්තුවේදී මෙම දළ ජාතික නිෂ්පාදිතය රුපියල් මිලියන 1,978,609 ක් ලෙස වාර්තාවී ඇත. ඒ අනුව 2016 වර්ෂයේ පළමු කාර්තුවේ ආර්ථික වර්ධනය සියයට 5.5 ක් ලෙස වාර්තා වී ඇත.

2016 පළමු කාර්තුව සඳහා ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වන කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා සහ භාණ්ඩ මත අය කෙරෙන සහනාධාර අඩුකල බදු, මුළු දළ දේශීය නිෂ්පාදිතයට දක්වන දායකත්වය පවතින මිල ගණන් යටතේ පිළිවෙළින් සියයට 7.4 ක්, සියයට 31.6 ක්, සියයට 52,4 ක් සහ සියයට 8.5 ක් ලෙස වාර්තා වී ඇත. මෙහිදී මෙම කාර්තුව සඳහා සමස්ත කර්මාන්ත හා සේවා ආර්ථික කටයුතු පිළිවෙළින් සියයට 8.3 ක් සහ සියයට 4.9 ක් වශයෙන් කැපී පෙනෙන වර්ධන වේගය වාර්තා වී ඇති අතර සමස්ත කෘෂිකාර්මික ආර්ථික කටයුතු සියයට 1.9 ක සුළු වර්ධනයක් වාර්තා වී ඇත.

2015 පළමුවැනි කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව සඳහා කෘෂිකාර්මික ආර්ථික ක්‍රියාකාරකම් අතුරින් "එළවළු වගා කිරීම", පොල් වගාව ඇතුළත් "තෙල් සහිත පලතුරු බෝග වගාව" සහ "සත්ව නිෂ්පාදන" පිළිවෙළින් සියයට 16.3 ක්, සියයට 10.0 ක් සහ සියයට 5.1 ක් ලෙස ඉහළ වර්ධන වේගයක් වාර්තා කර ඇත. එනමුදු "තේ වගා කිරීම" සියයට සෘණ 11.6 ක්, රබර් වගා කිරීම" සහ "කරදිය මත්ස්‍ය කර්මාන්තය" යන කෘෂිකාර්මික ආර්ථික කටයුතු වෙන් වෙන් වශයෙන් සියයට 2.6 ක් බැගින් වූ සෘණ වර්ධන වේගයක් වාර්තා වී ඇත.

කර්මාන්ත අංශය සැලකීමේදී විශේෂයෙන් 2016 පළමු කාර්තුව තුළදී දළ දේශීය නිෂ්පාදනයට දක්වන දායකත්වය සියයට 31.6 ක් දක්වා වාර්තාගත වර්ධනයක් පෙන්නුම් කරයි. එසේම කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධන වේගයද මෙම කාර්තුව තුළදී කැපී පෙනෙන ලෙස සියයට 8.3 කින් ඉහළගොස් ඇත. මේ සඳහා ඉහළම දායක්තවයක් ලබාදෙන "ඉදිකිරීම් කර්මාන්තය" 2015 පළමු කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව තුළදී සියයට 12.0 කින් කැපී පෙනෙන වර්ධන වේගයක් වාර්තා කර ඇත. එමෙන්ම "විදුලිය නිෂ්පාදන කර්මාන්තය", "රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන", "ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය" සහ "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන" යන ආර්ථික කටයුතු 2015 පළමු කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව තුළදී පිළිවෙළින් සියයට 10.1 ක්, සියයට 7.0 ක් සහ සියයට 1.2 ක් සහ සියයට 1.9 ක් ලෙස සතුටුදායක වර්ධන වේගයක් වාර්තා කර ඇත. එසේම මෙම කාලසීමාව තුළදී "පතල් හා කැනීම් කර්මාන්තය" සඳහා වාර්තා වූයේ සෘණ 1.5 ක වර්ධනයකි.

සමස්ත දළදේශීය නිෂ්පාදිතයට ඉහළම දායකත්වයක් ලබාදෙන (සියයට 56.4) සේවා ක්‍රියාකරකම් 2015 පළමු කාර්තුවට සාපේක්ෂව 2016 පළමු කාර්තුව තුළදී සියයට 4.9 ක වර්ධන වේගයක් ළඟා කරගෙන ඇත. 2015 පළමු කාර්තුවට සාපේක්ෂව විශේෂයෙන් "මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවා කටයුතු", "තොග සහ සිල්ලර වෙළඳාම් කටයුතු", "අධ්‍යාපන සේවා" සහ "අනෙකුත් පුද්ගල සේවා" යන සේවා පිළිවෙළින් සියයට 15.9 ක්, සියයට 5.7 ක්, සියයට 5.9 ක් සියයට 6.7 ක් වශයෙන් ඉහළ වර්ධන වේගයන් මෙම කාර්තුව තුළදී වාර්තා කර ඇත.

DEPARTMENT OF CENSUS & STATISTICS COLOMBO
LIBRARY